විජේරත්න පතිරාජ

# අමා දහර ප්‍රාසාංගික දැහැන

ඕස්ට්‍රේලියාවේ මෙල්බන් පුරවරයෙහි බේසන් සෙන්ටර් රගහලට මා පිවිසියේ විශේෂ අමුත්තකු ලෙස ලද ආරාධනයක් අනුවය. වසර 12 ක පමණ කාලයක සිට පවත්වාගෙන එනු ලබන ඩැන්ඩිනොන් නර්තන පාසලේ වාර්ෂික නර්තන මංගල්‍යය ඔස්ට්‍රේලියාවේ සංචාරයකට පැමිණ සිටින මට ඉමහත් ආශ්වාදයක් ලබා දුන් මාහැගි අවස්ථාවක් ලෙස දැනුණේ පුරා හෝරා දෙකකට වැඩි කාලයක් මෙහි වෙසෙන අපේ පුරුදු සම්ප්‍රදායික වැඩ සටහන් ඇසුරෙනි. එහෙත් අමා දහරේ ප්‍රසංගාවලිය එකිනෙකට වෙනස් වූ සම්ප්‍රදායික මෙන්ම නව නිර්මාණවලින්ද සරසා තිබීම එහි ආකර්ෂණය වැඩි කිරීමට එක් හේත=වක් විය. විවිධත්වය හා පර්යේෂණාත්මක ප්‍රවේශවලින් යුක්තවීමද එහි සාරත්වය තිව්‍ර කිරීමට හේතු වූ බව සිත්ගත් අවස්ථා කීපයක් සමග විමසා බැලීම මෙහිදී වටින්නේ යයි සිතමි.

උන්මාද චිත්‍රා රංගනය අප බොහෝවිට විවිධ නිර්මාණ ඔස්සේ දකින ඓතිහාසික පුවත අතික්‍රමණය වන ලෙස ප්‍රතිනිරූපනය



සිංහල දරුවන් සිය ගණනකගේ සුරුවිරුකම් දැක ගැනීමේ දුර්ලභ අවස්ථාවක් උදා වූ බැවිනි.

සංක්‍රමිකයන් හැටියට මෙම දේශයට පැමිණෙන බොහෝ තරුණ පිරිස් තම අධ්‍යාපන කටයුතු හා රැකියා අවස්ථා අරමුණු කොට ගෙන පැමිණීමෙන් පසු එකී පවුල්වල ඊළඟ පරම්පරාවේ දූ දරුවන්ට මෙහෙදී මුහුණපෑමට සිදුවන සංස්කෘතික නන්නත්තාරවීම පිළිබිඳව වැඩිහිටි පරම්ප-රාවලට දැනෙන විප්‍රලම්බ ශෝකය විවිධ අවස්ථා වලදී ප්‍රකාශ වී ඇති කරුණකි. මලේ පුවත්පත් ලිපිවලින්ද මේ පිළිබඳව අවධානය යොමු කර ඇත්තෙමි. ඊට හේත=ව සිංහල පවුල්වල දූ දරුවන් මෙම පරිසරය තුළදී වේගයෙන් මව් බසින් ඈත්වීමත් සිංහල සෞන්දර්ය කලාවන්ගෙන් ඈත්වීමත් හේතුකොටගෙන ඔවුන් තුළ ජාතිකත්වය පිළිබඳව ගැටළු ඇතිවීමනොවැළැක්විය හැකි කරුණක් වන හෙයිනි. දරුවන්ගේ පෞරුෂ වර්ධනය සඳහා ජාතියක් සතු මව්බස නැටුම ගැයුම රැඳුම ආදිය සම්පතක් ලෙස මනෝවිද්‍යා-වේද පිළිගැනීම වේ. අමා දහර රංගායතනය අපේ සිංහල අනාගත පරම්ප-රාවේ කොටසකට අපගේ සංස්කෘතික උරුමය ජනිත කිරීමට ගෙන ඇති වැඩ පිළිවෙල කම්බන්ධව මගේ කෘතඥතාව පළමුව පුද කරන් කැමැත්තෙමි.

සංස්කෘතික ප්‍රසංගය අයිතමයන් පහළොවකින් පමණ සම්පූර්ණ කිරීමේදී කාලවේලාව රසිකයන්ට නොදැනෙන ලෙස ගලායන පරිදි ඒවායේ ආකෘතිය හා අන්තර්ගතය සිත්ගන්නා ලය මානයකින් පෙළගස්වා තිබීමද අගය කළ හැකිය. ශ්‍රී ලංකාවේ වුවද බොහෝවිට ආයතනික වර්ෂ පූර්ණ නර්තන ප්‍රසංග නිමවන්නේ හුරු වීමකි. ප්‍රකට ශාන්තිකර්මයක් වන රිද්දි යාගයේ දැකුම්කළු අවස්ථා ප්‍රසංගිකත්වයට පත්කිරීමට සෑහෙන වෙහෙසක්ගෙන තිබුණි. උතුවන්කන්දේ සූර සරදියෙල් පිළිබඳව මතුකර තිබූ නව මානය බොහෝ වෙනත් නර්තන නිර්මාණයකට හසු නොවූ අපූර්වත්වයක් විය. කුවේණිය හා ගජමන්නෝනා පුවතද එකී චරිත කාන්තා විමුක්තිය සඳහා දල්වන ලද පහන්සිළු වැනි විය. මෙම දර්ශන වලින් මතුකළ යුතු ලැඹුරු අර්ථනිරූපණ සඳහා ප්‍රශස්ත රංග වින්‍යාස යොමුකළ යුතුව තිබුණි.නර්තන විලාස මතුකිරීමේ දී ඒ ඒ චරිත හා අවස්තා වල විවිධත්වය පෑම සඳහා ගායනය හා රංගනය සූක්ෂම ලෙස සංකළනය කිරීමට අවධානය යොමු විය යුතුවේ. සීගිරි අර්ථකථනයද සිත් ගන්නා සුළු අයිතමයකි. ළමා කතන්දර හා ළමා ගී පිළිබඳ අවධානය යොමුකිරීම ළමා ලෝකයට කළ ආශිර්වාදයකි. ප්‍රසංගයේ කැපී පෙනෙන රංගයක් වූ භාරතීය නර්තන රංග විලාසයන් දැරියනගේ ශිල්පීය කුසලතා මනා ලෙස ශික්ෂණය කළ වින්‍යාසයක් ලෙස දැක්විය හැකිය.

සමස්ථයක් ලෙස ගෙන විමසා බලන කල ශ්‍රී ලංකාවෙන් එපිට යුරෝපීය පරිසරයක අපගේ ජාතික නර්තන උරුමයන් අනාගත සිංහල දරු පරපුරකට යොමු කිරීමකට දරන වෑයමකදී එහි අඩුපාඩු හුවා දැක්වීමට වඩා සුවහසක් දුෂ්කරතා මධ්‍යයෙහි දෙසීයක් පමණ ළමා හා තරුණ දරු පිරිසක් සමග දොරට වඩින ලද ප්‍රසංගය ශ්‍රී ලාංකිකයන් වන අප කාටත් ආඩම්බර විය හැකි අවස්ථාවක් වූ බව ප්‍රකාශ කළ හැකිය. ඒ සඳහා මුල් වී කයහුතු කළ ශිල්පිනි අමා සිරිවර්ධන මිය ඇත=ළු ගුරු මණ්ඩලයටත් කාර්ය මණ්ඩලයටත් සමස්ත ශ්‍රී ලාංකික සහෘදයන්ගේ ආශිර්වාදය හිමිවිය යුතුය.




25 වන පිටෙන්

වන වෘත්තීය පුහුණුවයි. එරට පිහිටා තිබෙන දැවැන්ත කාර්මික විදුහල් හරහා අතිවිශිෂ්ට මේසන්වරුන්, වැද්දුම්කරුවන්, විදුලි කාර්මික ශිල්පීන්, මෝටර් කාර්මිකයන් හා වායුසමීකරණ, ශීතකරණ ශිල්පීන්, වඩුවන් වැනි මෙකී නොකී වෘත්තිකයන් විශාල සංඛ්‍යාවක් රටට බිහිවෙන අතර ඔවුන් ඉතා ඉහළ ආදායම් ලබන ශ්‍රමිකයන් පිරිසක් බව මෙහි අවධාරණය කිරීම වටිනවා. ෆින්ලන්ත ශිෂ්‍ය ගහනයෙන් 55%ක්ම තෝරාගන්නේ වෘත්තීය අධ්‍යාපනය බව මා කී විට මගේ ඇමරිකානු ගුරුවරුන් එය විශ්වාස කිරීමට මැලිවුණා. තෙවන විකල්ප මාර්ගය වන්නේ වයස 16දී ළමයෙකු යම් වැඩ ක්ෂේත්‍රයට කැමති නම් පාසල මැදිහත්වී ඔහු/ඇය සුදුසු රැකියාවකට යොමුකිරීමයි. රැකියාවේ නියැලෙන අතරතුරදී ඔහුට /ඇයට අවශ්‍ය නම් උසස් අධ්‍යාපනය හැදැරීම උදෙසා පඩි සහිත නිවාඩු හා අනෙකුත් පහසුකම් හාම්පුතු විසින් අනිවාර්යයෙන්ම ලබාදිය යුතුයි. එහෙත් මේ තෙවැනි මාර්ගය තෝරාගන්නේ ෆින්ලන්ත ශිෂ්‍ය ගහනයෙන් 5%ක් වැනි සුළුතරයක්. අතරමැද විවේක කාලයන් ගණනාවක් පිරිනැමෙන ෆින්ලන්ත පාසල්වල මිනිත්තු 75කින් සමන්විත ඉගැන්වීම් වාර 3ක් හෝ 4ක් තිබෙන අතර බොහෝ විට පාසල් වේලාව උදේ 9ත් හවස 2ත් යන කාලපරාසයට සීමාවෙනවා. ෆින්ලන්ත ගුරුවරයෙකුගේ වාර්ෂික ඉගැන්වීම් කාලය පැය 600ක් වන අතර ඇමරිකානු ගුරුභවතෙකුට එය පැය 1080ක් ෆින්ලන්ත පංති කාමරයක සිටින ළමුන් සංඛ්‍යාව 15ක්වන අතර විෂයභාර ගුරුවරුන් ඔවුන් සම අවම වශයෙන් වසර 6ක් ගතකළ යුතුයි. එරට ගුරු*ගෝල සබඳතා ඉතා ශක්තිමත් වී තිබෙන්නේ හැම දරුවා ගැනම සොයාබැලීමට ගුරුවරයාට විසල් ඉඩහසරක් සලසා දී ඇති නිසායි.

## ඉහළ පිළිගැනීම

ෆින්ලන්තයේ වැඩිම පිළිගැනීමක් ඇත්තේ ගුරු වෘත්තියටයි. වාර්ෂිකව ගුරු වෘත්තිය සඳහා ලක්ෂ ගණනින් අයදුම්පත් ගලාඑන නමුත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව තෝරාගන්නේ ඉන් විශිෂ්ටතම 10%යි. ෆින්ලන්ත ගුරුවරයෙකුගේ සාමාන්‍ය මාසික වැටුප ඇමරිකානු ඩොලර් 4167ක් (රුපියල් 633,000ක්) පමණ වෙනවා. මේ ගුරුවරුන් කෙතරම් විශිෂ්ටයන්ද කිවහොත් ෆින්ලන්ත දරුවන් අධ්‍යාපනය ලබා දෙන්නෙ ටියුෂන් හෝ වෙනත් අමතර ඉගැන්වීම්වලින් පීඩනයට පත් නොකොට, අධ්‍යාපනය ලැබීම වෙනුවෙන් නොමැරී මැරෙන ඇමරිකානු හා ආසියානු දරුවන් අබිබවා ඔවුන් සියලූ ගෝලීය මට්ටමේ තරග විභාගවලින් පෙරට ගැනීමට සමත් වී තිබෙනවා. පාසල් කාලයේදී ඇතිවන ඒකාකාරීබව ෆින්ලන්ත ගුරුවරුන් හා ළමුන් බිඳ දමන්නේ සැබෑ ජීවිතයේදී අත්‍යවශ්‍ය වන මැහුම් ගෙතුම්, ඉවුම් පිහුම්, වෘත්තීය ලෙස ශුද්ධ පවිත්‍ර කිරීම්, ගෙදරදොරට අවශ්‍ය සුළුසුළු වඩුවැඩ, පයිප්ප වැඩ ඉගැන්වීම හරහා. ඉතින් ලොවේ හොඳම අධ්‍යාපන ක්‍රමය ඇත්තේ ෆින්ලන්තයේ බැව් මා පවසන්නේ කිසිදු පැකිලීමකින් තොරවයි.

පන්නරය - රාවය